ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. UPLG/MG/A/SYBPS/ACC/2023/58
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 මැයි 15 දින.

ජාතික විගණන උප කාර්යාලය
හුලංදාව
මොනරාගල.

ලේකම්
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව
17 MAY 2024

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත:- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, බදුල්ල.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } UPLG/MG/A/SYBPS/ACC/2023/58    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2024 මැයි 15 දින.

ලේකම්
සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව.

**සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>**

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

AnyScanner

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියට අදාල ලෙජර් ගිණුමේ මුදල් ශේෂයක් නොතිබුණද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 3,953,604 ක් ලෙස දැක්වීමෙන් මුදල් හා සමාන දෑ එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති ගිණුමේ ලෙජර් ගිණුම අනුව ශේෂයක් නොතිබුණද මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ එහි ශේෂය රු. 3,953,604 ක් ලෙස දැක්වීමෙන් ජංගම වගකීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(iii) පොදු තැන්පත් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුද්දර බදු මුදල රු. 170,198 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග ලේඛන අනුව වීථි ලාම්පු ඉතිරි තොගය රු. 310,174 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 543,172 ක් ලෙස දැක්වීමෙන් ඉතිරි තොගය රු. 232,998 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(v) සමාලෝචිත වර්ෂය තුල වැඩ අවසන් කරන ලද නිමි වැඩ වටිනාකම රු. 3,562,734 ක් වූ කර්මාන්ත 05 වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් දේපල පිරියත උපකරණ එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(vi) ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල මිලදී ගන්නා ලද රු. 164,925 ක් වටිනා උපකරණ 05 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපල පිරියත උපකරණ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(vii) ප්‍රාදේශීය සභාවට අයත් ස්ථාන 03 ක් සඳහා විදුලි සම්බන්ධතා ලබා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල වැයකර තිබුණු රු. 155,307 ක් ගොඩනැගිලි යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

SCAN AnyScanner

(viii) සමාලෝචිත වර්ෂය තුල ප්‍රාදේශීය සභාව විසින් මිලදී ගන්නා ලද රු. 2,718,780 ක උපකරණ 02 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ලී බඩු උපකරණ යටතේ රු. 2,888,460 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ලී බඩු උපකරණ ශේෂය රු. 169,680 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ix) සමාලෝචිත වර්ෂය තුල බ්‍රෙලර් මැෂින් එකක් මිලදී ගැනීම සඳහා දරන ලද රු. 2,590,000 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 2,500,000 ක් ලෙස දැක්වීමෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු. 90,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(x) ඉකුත් වර්ෂවල සහ සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කරන ලද කර්මාන්ත 02 ක වටිනාකම රු. 54,717,294 ක් වුවත් එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 58,413,924 ක් ලෙස දැක්වීමෙන් ගොඩනැගිලිවල ශුද්ධ වටිනාකම රු. 3,696,630 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(xi) සමාලෝචිත වර්ෂය තුල සභාවට ලැබී තිබුණු ප්ලාස්ටික් ජලටැංකි 02 ක් සහ Tab පරිගණක යන්ත්‍රයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි.

(xii) සමාලෝචිත වර්ෂයේ සතිපොල ප්‍රමාද ගාස්තු රු. 234,868 ක් වුවත් එය මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු. 134,868 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සතිපොල ප්‍රමාද දඩ ආදායම රු. 100,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(xiii) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය සඳහා ලද රු. 26,665,930 ක් සහ ඉන් ප්‍රාග්ධන වියදම ලෙස වැයකර තිබුණු රු. 25,282,600 ක් හා අයභාර වියදම් ලෙස වැයකර තිබුණු රු. 1,383,330 ක් සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

### 1.5.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු. 141,107,722 ක් වූ වත්කම් විෂයයන් 03ක් සහ වගකීම් විෂයයකට අදාලව වෘත්තීය තක්සේරුකරුවන්ගේ වාර්තා, හිමිකම් ඔප්පු සහ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, හිඟ හිට සතිපොල බදු ලේඛනය සහ තැන්පත් ලේඛනය ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

AnyScanner

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

SCAN AnyScanner

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

SCAN AnyScanner

1.6 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | - | සභාවට අයත් වාහන 03 කට අදාල අනතුරු 04 ක් සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 15 දින වන විට අනතුරු සිදු වී මාස 02 සිට මාස 36 දක්වා කාලයක් ගත වී තිබුණද යොමුගත මුදල් රෙගුලාසි අනුව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 37,169 | මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2014 දෙසැම්බර් 05 දිනැති අංක 9/ආ/4 දරන මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික කටයුතු, සමාජ සුභ සාධන සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙහි 03 ඡේදය | 267,826 | අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතියකින් තොරව සභාව සතු වාහන 02කට අදාලව අවස්ථා 02 කදී අලුත්වැඩියා කටයුතු සඳහා ගෙවීම් කර තිබුණි. |
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02(IV) ඡේදය | 879,985 | 2023 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවා තිබුණද මේ සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබා ගන්නා වාර්තා මගින් පැමිණීම හා පිටවීම් වේලාවන් සනාථ කරගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,313,737 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 943,464 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 3,370,273 කින් ශුද්ධ වැඩිවීමක් සිදුවී තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 30,340 | - | - | - | 5,000 | - | - | - |
| (ii) | කුලී | 25,536,256 | 21,701,665 | 21,705,990 | (4,325) | 12,897,775 | 12,335,379 | 11,660,769 | 674,610 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,960,400 | 1,225,800 | 1,221,100 | 4,700 | 1,830,200 | 1,052,600 | 1,037,600 | 15,000 |
| (iv) | වෙනත් ආදායම් | 13,760,187 | 10,321,420 | 6,527,518 | 3,763,902 | 16,916,814 | 10,425,389 | 7,933,204 | 2,492,185 |
| | එකතුව | 41,287,183 | 33,248,885 | 29,454,608 | 3,794,277 | 31,649,789 | 23,813,368 | 20,631,573 | 3,181,795 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 33,248,885 ක මුළු ආදායමෙන් වර්ෂය අවසාන වන විට රු. 3,794,277 ක් අයකරගෙන නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 11 ක් විය.

#### 2.2.3 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂයන්ට අදාලව සභාව සතු දේපල බදුදීම වෙනුවෙන් අයවිය යුතුව පවතින රු. 5,495,856 ක කුලී ආදායම අයකරගෙන නොතිබුණි.

AnyScanner

### 2.2.4 කුලී

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 1,355,400 ක් වූ කඩ කාමර කුලී ආදායමෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 28,400 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු. 125,650 ක හිඟ කඩ කාමර කුලී ආදායමින් වර්ෂය තුලදී රු. 107,650 ක් අයකරගෙන නොතිබුණු අතර එය වර්ෂය ආරම්භයේ පැවති කඩ කාමර කුලී මුදලින් සියයට 86 ක් විය. ඒ අනුව හිඟ කඩ කාමර කුලී අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී තත්ත්වයක පැවතුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනා ගැනීම සඳහා 2023 වර්ෂයේ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) පරිසර ආරක්ෂණ බලපත්‍රවල වලංගු කාල සීමාව අවසන් වූ කර්මාන්ත 08 ක් සඳහා නැවත පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 57 ක් 2023 දෙසැම්බර් 15 දින වන විට බදු පදනම මත ලබා දී තිබුණු අතර එම කඩ කාමර 57 න් කිසිදු දිනක ව්‍යාපාර බදු, කර්මාන්ත බදු හෝ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණු අතර වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ආයතන වෙළඳ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ව්‍යාපාර කටයුතුවල නිරත වන බව නිරීක්ෂණය විය.

### 2.2.6 වෙනත් ආදායම්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂයේ සිදුකරන ලද දැන්වීම් පුවරු සමීක්ෂණයට අනුව හඳුනාගෙන තිබුණු දැන්වීම් පුවරු 126 ක් වෙනුවෙන් 2023 දෙසැම්බර් 15 දිනට අයවිය යුතු රු. 599,565 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි.

(යොමුව:- UPLG/MG/A/SYBPS/2023/AQ/44- 2024.01.02)

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව ජල පාරිභෝගිකයින් 131 ක ගෙන් අයවිය යුතු රු. 173,119 ක හිඟ ජල ගාස්තු 2023 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

### 2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 272,500 ක් සහ මුද්දර ගාස්තු රු. 4,770,082 ක් විය.

### 2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) ප්‍රාදේශීය සභාවට අයත් දොඹගහවෙල සති පොල රු. 6,855,555 ක වාර්ෂික බදු මුදලකට පෞද්ගලික පාර්ශවයක් විසින් ලබාගෙන 2022 දෙසැම්බර් 21 වන දින සභාවේ සභාපතිවරයා සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණු අතර 2023 මාර්තු 14 දිනැති ලිපිය මගින් බදුකරු විසින් තමාට පොළ පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් නැවත සති පොළ සභාවට භාර ගන්නා ලෙස දන්වා තිබුණි. මෙහිදී නැවත බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා 2023 අප්‍රේල් 24 දින ලංසු කැඳවා තිබුණු අතර අවම ලංසු මුදල ලෙස රු. 3,004,000 ක මුදලක් දක්වා තිබුණද 2023 මැයි 15 දිනැති අංක 12/4/8/M/28/2022 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය මගින් අවම ලංසු මුදල පෙර බදුකරුගේ ලංසු මුදල වූ රු. 6,855,555 ක් විය යුතු බව දක්වා තිබුණි. ඒ අනුව අවම ලංසු මුදල මාස 08 ක් සඳහා රු. 4,570,370 ක් විය යුතු නමුත් අවම ලංසු මුදල ලෙස රු. 3,004,000 ක් සඳහන් කර තිබීමෙන් සති පොළ, 2023 මැයි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රු. 3,207,500 ක මුදලකට වෙනත් බදුකරුවෙකු විසින් ලබාගෙන තිබුණි. මේ අනුව සභා අරමුදලට රු. 1,362,870 ක පාඩුවක් සිදු වී තිබුණි. තවද සති පොළ මුල් අවස්ථාවේදී බදු ගත් බදුකරු විසින් ආරක්ෂිත ඇප තැන්පත් ලෙස තැන්පත් කර තිබුණු රු. 1,713,889 ක මුදලක් 2023 අගෝස්තු 16 දිනැති අංක 8-146 දරන රිසිට්පත් පත්‍රය මගින් ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව පොළ භූමියේ දෙමහල් වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 10 ක් 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 15 දින වන විටත් බදු දී නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ අංක 03 කඩ කාමරය රු. 117,450 ක් මූලික මුදලකට 2021 ඔක්තෝබර් 06 දින සිට වසර 03 ක් දක්වා බදු දී තිබුණු අතර මූලික මුදල් වාරික 11 කින් අයකර ගැනීමට තීරණය කර තිබුණි. 2022 සැප්තැම්බර් වන විට මූලික මුදල් ගෙවා අවසන් කළයුතු වුවත් අදාල මුදලින් රු. 96,102 ක් අයකර ගැනීමට තිබියදී 2023 මාර්තු 27 දින බදුකරු විසින් කඩ කාමරය සභාවට භාරදී තිබුණි. මූලික මුදල් ගෙවීමට තිබුණු කාලය ඉක්මවා ගොස් තිබියදී එය අයකර ගැනීමකින් තොරව අදාල කඩ කාමරය සභාව විසින් බාරගෙන තිබුණු අතර මූලික මුදල් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධයෙන් කොන්දේසි ගිවිසුමට ඇතුලත් කරගෙන නොතිබුණි.

SCAN AnyScanner

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

(i) 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රය මගින් සභාව විසින් කසල ශෝධනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ගාස්තු අයකල යුතු බව දක්වා තිබුණද 2023 වර්ෂයට අදාලව කසල සඳහා ගාස්තු අයකළ යුතු ආයතන හඳුනාගෙන අදාල ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභාව විසින් 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රයේ ත්‍රී රෝද රථ ගාල් තුල ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීම සඳහා රු. 5,000 ක මුදලක්ද මාසික ගාස්තුව ලෙස රු. 150 ක මුදලක් ද අයකරන බව දක්වා තිබුණද ත්‍රී රෝද රථ ගාල් සඳහා අතුරු ව්‍යවස්ථාවක් සභාව විසින් සකස් කර හෝ වැළඳගෙන නොතිබුණි.

**(ආ) ජල ගාස්තු**

සභාව විසින් පවත්වා ගෙන යනු ලබන දෙමටබැද්ද ජල ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා ජලය පානය කිරීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න තහවුරු කර ගැනීමට ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය, නොසැලකිල්ල හා නියමිත ක්‍රියාපිළිවෙත් අනුගමනය නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට අයත් වාහන අනතුරු 02 කට අදාලව රක්ෂණ වන්දි ලෙස ලැබිය යුතු රු. 474,578 ක් 2023 දෙසැම්බර් 15 වන විටත් ලබාගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාවට අයත් අංක UPZA-3137 දරන බැකෝලෝඩර් යන්ත්‍රය 2020 සැප්තැම්බර් 08 අනතුරකට ලක් වී තිබුණු අතර අලුත්වැඩියා කිරීම සඳහා 2020 ඔක්තෝබර් 08 දින රු. 183,006 ක ට පෞද්ගලික ආයතනයකින් මිල ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි.එහෙත් රටේ පැවතුණු තත්ත්වය මත අවශ්‍ය අමතර කොටස් හා උපකරණවල හිඟතාවය හේතුවෙන් අලුත්වැඩියාව සිදුකර ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමින් 2023 අප්‍රේල් 03 දින රු. 362,388 කට නැවතත් එම ආයතනයෙන් මිල ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණද 2023

AnyScanner

දෙසැම්බර් 15 දින වන විටත් අලුත්වැඩියාව සිදුකරගෙන නොතිබුණු අතර රක්ෂණ වන්දි මුදල්ද ලබාගෙන නොතිබුණි. මේ අනුව බැකෝලෝඩර් යන්ත්‍රයට අදාල අලුත්වැඩියා කටයුතු දිගින් දිගටම සිදුකර නොගැනීම හේතුවෙන් අදාල උපාංගවල මිල ඉහල යාම මත මුල් අවස්ථාවට වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**(අ) කාර්ය මණ්ඩල පුරප්පාඩු**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව නිලධාරීන් 07 කගේ පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි.

**(ආ) අතිරික්ත කාර්ය මණ්ඩලය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ සංවර්ධන නිලධාරි තනතුරට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 08 කගේ අතිරික්තයක් පැවතුණි.

**(ඇ) සේවක ණය**

සභාවේ සේවය කළ නිලධාරීන් 03 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 168,378 ක සේවක ණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි.

(ආ) සභාව සතු වාහන 2 ක එන්ජින් අංකද එක් වාහනයක චැසි අංකයද වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් හා චැසි අංක සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය.

(ඇ) ලියාපදිංචි අංක RC – 2252 හා 49 -0241 දරන ට්‍රැක්ටර් රථ 02 හි මයිලෝ මීටර් අක්‍රීය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කිරීමකින් තොරව රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණි.

AnyScanner

(ඇ) ලියාපදිංචි අංක LP -3246 දරන ජල බවුසර් රථයේ මයිලෝමීටරය අනුව ධාවනය කර ඇති කිලෝමීටර් ගණන 2968 ක් වුවත් දෛනික ධාවන සටහන් පොත අනුව එය කිලෝමීටර් 2849 ක් ලෙස සටහන් කර තිබීමෙන් වාහනයේ මයිලෝමීටරය දෛනික ධාවන සටහන් පොත අනුව මයිලෝ මීටරයට වඩා කිලෝමීටර් 119 ක් වැඩියෙන් ධාවනය කර ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) සභාවට අයත් පුස්තකාල 04 ක පාඨකයින්ට ඉකුත් වර්ෂයන්ට අදාලව ලබාදී තිබුණු පිරිවැය රු. 128,184 ක පුස්තකාල පොත් 562 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත භාරදී නොතිබුණි.

## 3.5 ප්‍රසම්පාදනය

සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු ටෙන්ඩර් දේපල 2023 වර්ෂය සඳහා බදු දීමට 2022 ඔක්තෝබර් 10 දින මිල ගණන් කැඳවා ජාතික පුවත්පත්වල දැන්වීම් පල කර තිබුණද අදාල දැන්වීමේ මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ මොනරාගල දිස්ත්‍රික්කය තුල ස්ථිර පදිංචිකරුවන්ට හා ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවලට පමණක් ලෙස සීමාකර තිබුණි. පුවත් පත් දැන්වීම් පලකිරීම සඳහා රු. 85,825 ක මුදලක් වැයකර තිබුණද ඉහත පරිදි ලංසු ඉදිරිපත් කළ හැකි පාර්ශව සීමා කිරීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් පල කිරීමට දැරූ වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය මගින් ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන කොමසාරිස් කාර්යාලය, බදුල්ල.

AnyScanner

| | | | | |
|---|---|---|---|---|
| (ii) ප්‍රාදේශීය සභාව විසින් 2022 නොවැම්බර් 18 දිනැති අංක 2307 දරන ගැසට් පත්‍රයේ ත්‍රී රෝද රථ ගාල් තුල ත්‍රී රෝද රථ ලියාපදිංචි කිරීම සඳහා රු. 5,000 ක මුදලක්ද මාසික ගාස්තුව ලෙස රු. 150 ක මුදලක් ද අයකරන බව දක්වා තිබුණද ත්‍රී රෝද රථ ගාල් සඳහා අතුරු ව්‍යවස්ථාවක් සභාව විසින් සකස් කර හෝ වැළඳගෙන නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී විධිමත් පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | අතුරු ව්‍යවස්ථාවක් සකස් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) <u>ජල ගාස්තු</u> සභාව විසින් පවත්වා ගෙන යනු ලබන දෙමටබැද්ද ජල ව්‍යාපෘතිය මගින් ලබා ගන්නා ජලය පානය කිරීමට සුදුසු තත්ත්වයේ පවතීද යන්න තහවුරු කර ගැනීමට ජල සාම්පල් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | කඩිනමින් ජල සාම්පල් තත්ත්ව පරීක්ෂණ සඳහා යොමුකර වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | බලප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳව අවධානය යොමුකළ යුතුයි. |

## 3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) නිලධාරීන්ගේ අකාර්යක්ෂමතාවය, නොසැලකිල්ල හා නියමිත ක්‍රියාපිළිවෙත් අනුගමනය නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය සභාවට අයත් වාහන අනතුරු 02 කට අදාලව රක්ෂණ වන්දි ලෙස ලැබිය යුතු රු. 474,578 ක් 2023 දෙසැම්බර් 15 වන විටත් ලබාගෙන නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව කාරුණිකව දන්වමි. | අදාල අලාභය රක්ෂණ ආයතන වෙතින් සහ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් අංක UPZA-3137 දරන බැකෝලෝඩර් යන්ත්‍රය 2020 සැප්තැම්බර් 08 අනතුරකට ලක් වී තිබුණු අතර අලුත්වැඩියා කිරීම සඳහා 2020 ඔක්තෝබර් 08 දින රු. 183,006 ක ට පෞද්ගලික ආයතනයකින් මිල ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණි.එහෙත් රටේ පැවතුණු තත්ත්වය මත අවශ්‍ය අමතර කොටස් හා උපකරණවල හිඟතාවය හේතුවෙන් අලුත්වැඩියාව සිදුකර ගැනීමට නොහැකි වූ බව සඳහන් කරමින් 2023 අප්‍රේල් 03 දින රු. 362,388 කට නැවතත් එම ආයතනයෙන් මිල ඇස්තමේන්තුවක් ලබාගෙන තිබුණද 2023 දෙසැම්බර් 15 දින වන විටත් අලුත්වැඩියාව සිදුකරගෙන නොතිබුණු අතර රක්ෂණ වන්දි මුදල්ද ලබාගෙන නොතිබුණි. මේ අනුව බැකෝලෝඩර් යන්ත්‍රයට අදාල අලුත්වැඩියා කටයුතු දිගින් දිගටම සිදුකර නොගැනීම හේතුවෙන් අදාල උපාංගවල මිල ඉහල යාම මත මුල් අවස්ථාවට වඩා වැඩි මුදලක් වැය කිරීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | රටතුල පැවති කොරොනා වසංගත තත්ත්වය මත මෙම අලුතුවැඩියා කටයුතු ප්‍රමාද වූ අතර මේ වන විට අදාල ආයතන වෙතින් නැවත මිල කැඳවුම් ඇස්තමේන්තු ලබා ගෙන පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත යොමු කර ඇත.අදාල අනුමැතිය ලද වහාම අලුත්වැඩියා කටයුතු සිදු කරන බව දන්වමි. | වාහන සහ යන්ත්‍ර අලුත්වැඩියාවන් අදාල කාල පරිච්ඡේදය තුල කඩිනමින් සිදු කල යුතුයි. |
| (ඇ) සභාව මගින් සේවා ඉටුකරගැනීමට පැමිණෙන සේවාලාභින් වෙත තේ පැන් සංග්‍රහ ලබා දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී සභා අරමුදලෙන් රු.85,085 ක් වැය කර තිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | දුර බැහැර සිට පැමිණෙන සේවාලාභින්ගේ අපහසුතාව මගහැරීම සඳහා මෙම සංග්‍රහය ලබා දුන් අතර 2024 වර්ෂය සඳහා මීට අදාලව ප්‍රතිපාදන වෙන් කර නොමැති බව දන්වමි. | ඵලදායි කාර්යයක් සඳහා සභා අරමුදල් වැය කල යුතුයි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාවට අයත් දොඩම්ගහවෙල සති පොළ රු. 6,855,555 ක මුදලකට පෞද්ගලික පාර්ශවයක් විසින් ලබාගෙන 2022 දෙසැම්බර් 21 වන දින සභාවේ සභාපතිවරයා සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණු අතර 2023 මාර්තු 14 දිනැති ලිපිය මඟින් බදුකරු විසින් තමාට පොළ පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් නැවත සති පොළ සභාවට භාර ගන්නා ලෙස දන්වා තිබුණි. මෙහිදී නැවත බදුකරුවෙකු තෝරා ගැනීම සඳහා 2023 අප්‍රේල් 24 දින ලංසු කැඳවා තිබුණු අතර අවම ලංසු මුදල ලෙස රු. 3,004,000 ක මුදලක් දක්වා තිබුණද 2023 මැයි 15 දිනැති අංක 12/4/8/M/28/2022 දරන පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය මඟින් අවම ලංසු මුදල පෙර බදුකරුගේ ලංසු මුදල වූ රු. 6,855,555 ක් විය යුතු බව දන්වා තිබුණි. ඒ අනුව අවම ලංසු මුදල මාස 08 ක් සඳහා රු. 4,570,370 ක් විය යුතු නමුත් අවම ලංසු මුදල ලෙස රු. 3,004,000 ක් සඳහන් කර තිබීමෙන් සති පොළ, 2023 මැයි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රු. 3,207,500 ක මුදලකට වෙනත් බදුකරුවෙකු විසින් ලබාගෙන තිබුණි. මේ අනුව සභා අරමුදලට රු. 1,362,870 ක පාඩුවක් සිදු වී තිබුණි. තවද සති පොළ මුල් අවස්ථාවේදී බදු ගත් බදුකරු විසින් | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | මුල් බදුකරු විසින් දොඩම්ගහවෙල සතිපොළ 2023 මාර්තු 04 දින නැවත සභාවට බාරදුන් අතර එය කඩිනමින් ටෙන්ඩර් කර වෙනත් බදුකරුවෙකු වෙත ලබා දිය යුතු බැවින් සභා ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව ටෙන්ඩර් කල නැත්නම් තක්සේරුගත මුදලකට බැවින් සතිපොළ කලින් ටෙන්ඩර් කිරීමේදී යොදා ගත් අවම ලංසු මුදල සඳහන් කර ගනිමින් ඉතිරි මාස 8 සඳහා අවම ලංසුව තීරණය කොට ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලදී. පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කල ලිපියට පිළිතුරු ලැබෙන විට ප්‍රසම්පාදන කටයුතු අවසන් වී තිබුණි. | බදුකරුවෙකු විසින් බදුගත් සතිපොළක් නැවත සභාවට භාර දුන් අවස්ථාවක සභා අරමුදලට අලාභ සහගත නොවන ආකාරයට නැවත බදුදීම සිදුකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ආරක්ෂිත ඇප තැන්පත් ලෙස තැන්පත් කර තිබුණු රු. 1,713,889 ක මුදලක් 2023 අගෝස්තු 16 දිනැති අංක 8-146 දරන චික්විසිෂන් පත්‍රය මගින් ගෙවා තිබුණි. | | | | |
| (ආ) ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව පොළ භූමියේ දෙමහල් වෙළඳ සංකීර්ණයේ පිහිටි කඩ කාමර 10 ක් 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 15 දින වන විටත් බදු දී නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | මෙම කඩ කාමර ප්‍රසම්පාදනය කළද එම කඩ කාමර ලබා ගැනීමට කිසිවෙකු ඉදිරිපත් වී නොමැති බව දන්වමි. | සභාව සතු කඩ කාමර බදු දී බදු ආදායම් රැස්කරගත යුතුයි. |
| (ඇ) ප්‍රාදේශීය සභාවට අයත් සියඹලාණ්ඩුව සතිපොළ පරිශ්‍රයේ අංක 03 කඩ කාමරය රු. 117,450 ක් මූලික මුදලකට 2021 ඔක්තෝබර් 06 දින සිට වසර 03 ක් දක්වා බදු දී තිබුණු අතර මූලික මුදල් වාරික 11 කින් අයකර ගැනීමට තීරණය කර තිබුණි. 2022 සැප්තැම්බර් වන විට මූලික මුදල් ගෙවා අවසන් කළයුතු වුවත් අදාල මුදලින් රු. 96,102 ක් අයකර ගැනීමට තිබියදී 2023 මාර්තු 27 දින බදුකරු විසින් කඩ කාමරය සභාවට භාරදී තිබුණි. මූලික මුදල් ගෙවීමට තිබුණු කාලය ඉක්මවා ගොස් තිබියදී එය අයකර ගැනීමකින් තොරව අදාල කඩ කාමරය සභාව විසින් බාරගෙන තිබුණු අතර මූලික මුදල් ගෙවීම පැහැර හරින ලද අවස්ථාවක ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධයෙන් කොන්දේසි ගිවිසුමට ඇතුලත් කරගෙන නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | හිඟ මුදල් අයකර ගැනීම සඳහා අදාල පාර්ශවයන් වෙත ලිඛිත දැනුවත් කිරීම සිදුකර ඇති බව දන්වමි. | හිඟ ආදායම් අයකරගත යුතුයි. |



AnyScanner

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව විසඳීමට කඩිනමින් පියවර ගන්නා බව දන්වමි. | සභාව විසින් භාවිතා කරන වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුයි. |
| (ආ) සභාව සතු වාහන 2 ක එන්ජින් අංකද එක් වාහනයක චැසි අංකයද වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් එන්ජින් හා චැසි අංක සමග නොගැලපෙන බව නිරීක්ෂණය විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව විසඳීමට අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් සිටින බව දන්වමි. | සභාව සතු වත්කම්වල අයිතිය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි. |
| (ඇ) ලියාපදිංචි අංක RC - 2252 හා 49 -0241 දරන ට්‍රැක්ටර් රථ 02 හි මයිලෝ මීටර් අක්‍රිය වී තිබුණු අතර ඒවා අලුත්වැඩියා කිරීමකින් තොරව රාජකාරි කටයුතු සඳහා යොදවා තිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | සභාවේ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම සඳහා කාර්මික නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මෙම ට්‍රැක්ටර් රථ 2 සේවයේ යොදවා ඇති අතර මෙම ගැටළුව කඩිනමින් විසඳීමට පියවර ගන්නා බව දන්වමි. | සභාව සතු වාහන හා යන්ත්‍ර අදාළ අවස්ථාවලදී අලුත්වැඩියා කළ යුතුයි. |
| (ඈ) ලියාපදිංචි අංක LP -3246 දරන ජල බවුසර් රථයේ මයිලෝමීටරය අනුව ධාවනය කර ඇති කිලෝමීටර් ගණන 2968 ක් වුවත් දෛනික ධාවන සටහන් පොත අනුව එය කිලෝමීටර් 2849 ක් ලෙස සටහන් කර | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | මේ සම්බන්ධයෙන් රියදුරු වෙත අවවාදාත්මක ලිපි 03 ක් නිකුත් කර නිදහසට කරුණු විමසා ඇති අතර වාහනවල මයිලෝමීටර් හා | සභාව සතු වාහන සේවයේ යෙදවීමේ කටයුතු විධිමත්ව සිදුකළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| තිබීමෙන් වාහනයේ මයිලෝමීටරය දෛනික ධාවන සටහන් පොත අනුව මයිලෝ මීටරයට වඩා කිලෝමීටර් 119 ක් වැඩියෙන් ධාවනය කර ඇති බව නිරීක්ෂණය විය. | | | ධාවන සටහන් පොත් මාසිකව පරීක්ෂා කිරීමට විෂය නිලධාරි වෙත උපදෙස් ලබාදුන් බව දන්වමි. | |
| (ඉ) සභාවට අයත් පුස්තකාල 04 ක පාඨකයින්ට ඉකුත් වර්ෂයන්ට අදාලව ලබාදී තිබුණු පිරිවැය රු. 128,184 ක පුස්තකාල පොත් 562 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නැවත භාරදී නොතිබුණි. | නව | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගන්නා බව දන්වමි. | පාඨකයින් වෙත ලබාදුන් පොත් නැවත ලබාගත යුතුයි. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව සතු ටෙන්ඩර් දේපල 2023 වර්ෂය සඳහා බදු දීමට 2022 ඔක්තෝබර් 10 දින මිල ගණන් කැඳවා ජාතික පුවත්පත්වල දැන්වීම් පල කර තිබුණද අදාල දැන්වීමේ මිල ගණන් ඉදිරිපත් කළ හැක්කේ මොනරාගල දිස්ත්‍රික්කය තුල ස්ථිර පදිංචිකරුවන්ට හා ලියාපදිංචි ස්වේච්ඡා සංවිධානවලට පමණක් ලෙස සීමාකර තිබුණි. පුවත් පත් දැන්වීම් පලකිරීම සඳහා රු. 85,825 ක මුදලක් වැයකර තිබුණද ඉහත පරිදි ලංසු ඉදිරිපත් කළ හැකි පාර්ශව | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී මෙම අඩුපාඩුව නිවැරදි කිරීමට පියවර ගන්නා බව දන්වමි. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව සිදු කළ යුතුයි. |



SCAN AnyScanner

සීමා කිරීම හේතුවෙන් පුවත්පත් දැන්වීම පල කිරීමට දැරූ වියදම නිෂ්කාරය වියදමක් බවට පත්ව තිබුණි.

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 06 කට අදාලව අනුමත කාර්ය මණ්ඩලය අනුව නිලධාරීන් 07 කගේ පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුවත් කර ඇත. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණකර ගත යුතුයි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ සංවර්ධන නිලධාරි තනතුරට අදාලව අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් 08 කගේ අතිරික්තයක් පැවතුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවාගත යුතුයි. |
| (ඇ) සභාවේ සේවය කළ නිලධාරීන් 03 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 168,378 ක සේවක ණය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය | හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගන්නා බව දන්වමි. | සේවක ණය ශේෂ කඩිනමින් අයකරගත යුතුයි. |



AnyScanner

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රාදේශීය සභාව විසින් පිළියෙලකර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 08 ක සියයට 06 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 07 ක සියයට 19 සිට සියයට 87 දක්වාද විචලනයන් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | පවත්නා | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. | ඉදිරියේදී නිසි පරිදි අයවැය සකස් කිරීමට පියවර ගන්නා බව දන්වමි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු වඩාත් තාත්විකව පිළියෙල කළ යුතු අතර එම ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුයි. |

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

කේ.එම්. ජයසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

පිටපත :- ගරු ආණ්ඩුකාර තුමා - ඌව පළාත



AnyScanner